සියලු හිමිකම් ඇවිරිණි/ All Rights reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**Provincial Department of Education - NWP**

**15 S I**

පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2018

First Term Test - Grade 11 - 2018

**විභාග අංකය ....................................** **ක්‍රිස්තියානි ධර්මය I** **කාලය පැය එකයි**

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. "දෙවියන් වහන්සේ අප සමඟය." යන අර්ථය ඇති වචනය වන්නේ,
    01. මෙසියස් ය. 02. එම්මානුවෙල් ය. 03. ක්‍රිස්තොස් ය. 04. අගපේ ය.

02. " අන්ධකාරයේ ඇවිද්ද සෙනග මහත් ආලෝකයක් දුටුවෝය" මෙලෙස දිවැස් වැකි ප්‍රකාශ කරන ලද්දේ,
    01. මීකා දිවැසිවරයා ය. 02. ජෙරමියා දිවැසිවරයා ය.
    03. යෙසායා දිවැසිවරයා ය. 04. ආමොස් දිවැසිවරයා ය.

03. දෙවියන් වහන්සේට සන්තක වීම උදෙසා ඉටු කළා වූ ජුදෙව් චාරිත්‍රය වන්නේ,
    01.චර්මච්ඡේදනයයි. 02. බෞතීස්මයයි.
    03. කැපකිරීමයි. 04. දේවමාළිගාවට යාමයි.

04. ස්නාවක ජොහාන් පොදු ජනතාවට ලබාදුන් අනුශාසනාව වන්නේ,
    01. නියමිත පමණට වඩා අය බදු නොගන්නා ලෙස ය.
    02. අඳනා දෙකක් ඇති අය නැති අයට දෙන්වා යන්න ය.
    03. කිසිවෙකුගෙන් බලහත්කාරයෙන් කිසිවක් පැහැර නොගන්නා ලෙස ය.
    04. ලැබෙන වැටුපෙන් සෑහී සිටින්න යන්න ය.

05. කැප කිරීමේ පිළිවෙත සඳහා ජේසු බිළිඳා රැගෙන ආ අවස්ථාවේ දෙව්මැදුරේ සිටි බැතිමතුන් දෙදෙනා වන්නේ,
    01. සිමියොන් හා අන්නා ය. 02. හන්නා හා එල්කානා ය.
    03. පෙනින්නා හා එල්කානා ය. 04. සිමියොන් හා හන්නා ය.

06. ස්නාවක ජොහාන්තුමා ජනතාවට ආරාධනා කළේ
    01. දේශනා ඇසීමට ය. 02. දේව රාජ්‍යය ගොඩනැගීමට ය.
    03. පසුතැවී සිත්හරවා ගෙන බෞතීස්මය ලැබීමට ය. 04. පරිසිවරුන්ට විරුද්ධව නැගී සිටින්නට ය.

07. ගලීල මුහුද හඳුන්වන තවත් නමක් වන්නේ,
    01. මළ මුහුද යි 02. රතු මුහුද යි. 03. කැස්පියන් මුහුද යි. 04. තිබේරියස් මුහුද යි.

08. "ප්‍රේරිත" යන්නෙහි අර්ථය වන්නේ,
    01. ධර්මදූත සේවකයන් යන්න යි. 02. විශේෂ මෙහෙයක් සඳහා පුහුණු කර යවනු ලැබූ යන්න යි.
    03. දේව පණිවිඩය ප්‍රකාශ කරන්නන් යන්න යි. 04. බෞතීස්ම ලබා දෙන්නන් ය.

09. "වග වලසුන් මැදට බැටළු පැටවුන් මෙන් යවමි" මේ ප්‍රකාශයෙහි අදහස වන්නේ,
    01. මිනිසුන් වගවලසුන් මෙන් නපුරු බව ය. 02. යහපත් අයට පීඩාවලට මුහුණදීමට සිදුවන බව ය.
    03. බැටළුවන් වගවලසුන් අතරට යවන බව ය. 04. ධර්මදූත සේවයේ දී අභියෝග ජය ගත යුතු බව ය.

10. ධර්මදූත චාරිකා වලට සහභාගී වී පැමිණි ශ්‍රාවකයින්ට සතුටු වන්නට යැයි ජේසුතුමා පැවසුවේ,
    01. ස්වර්ගයේ නම ලිය වී තිබෙන නිසා ය. 02. නපුරු බලය තමන්ට අවනත වීම නිසා ය.
    03. රෝගීන් සුවවීම නිසා ය. 04. මිනිසුන් ශුභාරංචිය පිළිගත් නිසා ය.

11. ආබ්‍රහම්ගේ දියණිය ලෙස ජේසුස් වහන්සේ පැවසුවේ,
    01. සමාරි ස්ත්‍රියටය. 02. කුදු ස්ත්‍රියටය 03. පව්කාර ස්ත්‍රියටය 04. මාර්තාටය.

12. "ස්වාමිනී මා ඔබගේ උපකරණයක් කරගත මැනව" මෙලෙස යාච්ඤා කළේ,
    01. පාවුල් තුමා ය 02. ස්තේපන් තුමා ය 03. අසීසියේ ෆ්‍රැන්සිස්තුමා ය. 04. ශු. අම්බ්‍රෝස් තුමා ය.

13. සබත් දින ජේසුස් වහන්සේ සුවකළ රෝගීන් දෙදෙනෙකු වන්නේ,
01. අංශභාග රෝගියා හා ලාදුරු රෝගියා ය. 02. දිය උදර රෝගියා හා අතක් පණ නැති මිනිසා ය.
03. අංශභාග රෝගියා හා දිය උදර රෝගියා ය. 04. අතක් පණ නැති මිනිසා හා ලාදුරු රෝගියා ය.

14. ජේසුස් වහන්සේ අන්තිම හුස්ම හෙලන විට පැවසූ වදන වන්නේ,
01. "මට පිපාසයි" යන්න ය.
02. "පියාණෙනි ඔබගේ හස්තයට මාගේ ආත්මය භාරදෙමි" යි යන්න ය.
03. "මොවුන් නොදැන කරන වරදට කමා වුව මැනව" යි යන්න ය.
04. මාගේ දෙවියනි, මාගේ දෙවියනි ඔබ මා අත්හැරියේ මක්නිසාද" යි යන්න ය.

15. එම්මාවුස් බලා ගිය ගෝලයන් දෙදෙනාගේ හදවත් දැවී ඇවිලී ගියේ ජේසුස් වහන්සේ,
01. නොපෙනී ගිය පසු ය. 02. රොටී ගෙන ආශිර්වාද කරන විට ය.
03. ශු. ලියවිල්ල පහදා දෙන විට ය. 04. පාර දිගේ ගමන් කරන විට ය.

16. ශ්‍රී ලාංකික කිතුනු අප ජාතික සිරිත් පැවැත්විය යුත්තේ,
01. ජාතිකාභිමානය ඉස්මතු වන ලෙස ය. 02. තමාට හැකි උපරිම අයුරිනි.
03. සෙසු අය අනුකරණය කරමිනි. 04. කිතුනු පැවැත්මට පටහැනි නොවන ලෙසිනි.

17. ලාසරුස්ට නොසැළකූ ධනපතියාට ප්‍රතිවිරුද්ධව ක්‍රියා කළ යුතු කිතුනුවා,
01. සැප සම්පත් නොමැතිව ජීවත් විය යුතු ය.
02. හිඟමන් අයදින අයට ආධාර කළ යුතු ය.
03. ප්‍රේමයෙන් යුතුව අසරණයන්ට සැළකිය යුතු ය.
04. තම ධනයෙන් දෙකෙන් කොටසක් දිළිඳුන්ට දිය යුතු ය.

18. රෝම අධිරාජ්‍යයට සේවය කළ ජාතියට ද්‍රෝහී වූ පීඩිත ජන කොටසක් ලෙස සැලකුයේ,
01. පව්කරුවන් ය. 02. අයකැමියන් ය. 03. එඬේරුන් ය. 04. කාන්තාවන් ය.

19. ශු බයිබලයේ වලාපටලය මගින් සංකේතවත් කරන්නේ,
01. දේව අභිමුඛත්වය යි. 02. ශුද්ධාත්ම බලය යි.
03. දේව අනුග්‍රහය යි. 04. දේව මඟ පෙන්වීම යි.

20. "අහෝ ධනවත් වූ ඔබට වන විපතක මහත .................... මෙහි හිස්තැනට සුදුසු පදය වන්නේ,
01. ඔබ හඬා වැළපෙනු ඇත. 02. ඔබට සාගිනි වනු ඇත.
03. ඔබ සැපවත් ජීවිතය විඳ හමාරය 04. ඔබ තෘප්තිමත් වනු ඇත.

21. දෙවිඳුන් ඊශ්‍රායෙල් ජාතිය පිහිටවනු ලැබුවේ,
01. මෝසෙස්ගේ නායකත්වයෙනි. 02. ආබ්‍රහම්ගේ නායකත්වයෙනි.
03. ජේසුස් වහන්සේගේ නායකත්වයෙනි. 04. ජාකොබ්ගේ නායකත්වයෙනි.

22. ජුදා සමාජය විනය ගරුක සමාජයක් බවට පත් කිරීමට උපකාරී වූයේ,
01. භාග්‍යය අට යි 02. ප්‍රේම පාරමිතාව යි. 03. දස පණත යි. 04. පවුලේ යාච්ඤාව යි.

23. ඊශ්‍රායෙල් ඉතිහාසයේ ආලේපනය ලැබූ ජන කණ්ඩායම් වන්නේ,
01. පූජකයින්, දිවැසිවරුන් හා රජවරු ය. 02. පූජකයින්, දිවැසිවරුන් හා ආදී පියවරු ය.
03. පූජකයින් රජවරුන් හා ශ්‍රාවකයින් ය. 04. පූජකයින්, රජවරු හා ජන නායකයින් ය.

24. ඊශ්‍රායෙල්වරු තම එඬේරා ලෙස සැලකුවේ,
01. මෝසෙස් ය. 02. ජේසුස් වහන්සේ ය. 03. ආදම් ය. 04. දෙවියන් වහන්සේ ය.

25. ස්නාවක ජොහාන්තුමා දේශනා කරනු ලැබුවේ,
01. ජෝර්දාන් ගඟ අසල ය. 02. ගලීල මුහුද අසල ය.
03. නයිල් ගඟ අසල ය. 04. බෙතෙස්දා පොකුණ අසල ය.

26. ප්‍රේම පාරමිතාව සඳහන්ව ඇති බයිබල් ග්‍රන්ථය වන්නේ,
01. උත්පත්ති පොත ය. 02. 1 කොරෙන්ති පොත ය.
03. මතෙව් ශුභාරංචිය ය. 04. ක්‍රියා පොත ය.

27. " අයිරේනියා" යන ග්‍රීක වචනයෙන් අදහස් කරන්නේ,
01. සීමා රහිත කමාවයි 02. සම්පූර්ණ යුක්තියයි. 03. නිම් නැති ප්‍රේමයයි 04. සම්පූර්ණ සාමයයි.

28. සිංහල, දමිළ, මුස්ලිම් ජන කොටස් උදෙසා තම ලැගුම් ගෙය පවා පරිත්‍යාග කළ පියතුමා වන්නේ,
01. ගරු චන්ද්‍රා ප්‍රනාන්දු ය. 02. ගරු තිස්ස බාලසූරිය ය.
03. ගරු ඇන්ඩෲ කුමාරගේ ය. 04. ගරු මයිකල් රොද්‍රිගු ය.

29. ජේසුස් වහන්සේගේ ඉගැන්වීම අනුව තමා වටා සිටින අවශ්‍යතාවෙන් පෙළෙන ඕනෑම කෙනෙකු,
01. තමාගේ සහෝදරයන් වේ. 02. තමාගේ අසල්වැසියන් වේ.
03. තමාගේ නෑදෑයන් වේ. 04. තමාගේ ශ්‍රාවකයන් වේ.

30. අප බලාපොරොත්තු වන දුක් උසුලන සේවකයන් වන්නේ,
01. ජෝබ් තුමා ය. 02. ජෙරමියා දිවැසිවරයා ය.
03. ජේසුස් වහන්සේ ය. 04. පාවුල් තුමා ය.

31. කිතුනු අප දෙවියන් වහන්සේට කීකරු වන විට,
01. අපට අයිති සම්පත් පරිත්‍යාග කළ යුතු වේ. 02. අධ්‍යාපනය අතහැරිය යුතු වේ.
03. දෙමාපියන් සහෝදරයන් අතහැරිය යුතු වේ. 04. ආදර්ශවත් ජීවිතය අතහැරිය යුතු වේ.

32. රජකම හා බැඳුණු මෙසියානු සංකල්පයේ ලක්ෂණයක් නොවන්නේ,
01. මෙසියස් වහන්සේගේ රාජ්‍යය සදාකාලික බව ය.
02. සාධාරණත්වය හා යුක්තිය පැවතීම ය.
03. එතුමා සාමයේ කුමාරයාණන් බව ය.
04. එතුමා ජුදා ජාතියට විශේෂ සැළකිල්ලක් දක්වන බව ය.

33. එබේර සංකල්පය වඩා අර්ථවත් ලෙස දක්වා ඇති පැරණි ගිවිසුමේ ග්‍රන්ථ දෙක වන්නේ,
01. යෙසායා හා ගීතාවලිය ය. 02. එසකියෙල් හා ගීතාවලිය ය.
03. මීකා හා එසකියෙල් ය. 04. ගීතාවලිය හා මීකා ය.

34. පාවුල් තුමාගේ ඉගැන්වීමට අනුව ප්‍රේමය නැති තැනැත්තා,
01. බොරුකාරයෙකි 02. අවිශ්වාස තැනැත්තෙකි
03. හිස් තැනැත්තෙකි 04. දිළින්දෙකි

35. වර්තමාන සමාජයේ සාමය සහජීවනය ඇති කිරීම සඳහා,
A - සමාජයේ දුසිරිත් වලට විරුද්ධ විය යුතුය.
B - වරද කරන අයට යහපත කළ යුතුය.
C - ස්වයං රැකියා ඇති කළ යුතුය
D - අසාධාරණයට විරුද්ධව කටයුතු කළ යුතුය.

මින් වඩාත් නිවැරදි පිළිතුර වන්නේ,
01. B හා C ය. 02. A හා B ය. 03. A හා C ය. 04. C හා D ය.

36. යහපත් කිතුනු පවුලක් ගොඩ නැගීමට නම්,
01. පවුලේ මූලිකත්වය ක්‍රිස්තුස් වහන්සේට දිය යුතුය.
02. ආත්මාර්ථකාමයෙන් තොර විය යුතුය.
03. දෙමාපිය දරු සෙනෙහස නොවෙනස්ව තිබිය යුතුය.
04. ඉහත සියල්ලම ක්‍රියාත්මක විය යුතුය.

37. දේව රාජ්‍යයේ පුරවැසි බව ලබා ගත හැකි වන්නේ,
01. දේව රාජ්‍යය පිහිටුවා ගැනීමෙනි. 02. දේව රාජ්‍යයට ඇතුළු වීමෙනි.
03. දේව රාජ්‍යයේ ලියාපදිංචි වීමෙනි. 03. දේව කැමැත්ත කිරීමෙනි.

38. තෙවන පරීක්ෂාවට ජේසුතුමාගේ පිළිතුර වන්නේ,
01. "මිනිසා කෑමෙන් පමණක් ජීවත් නොවන්නේය" යන්න ය.
02. "නුඹේ දෙවි ස්වාමීන් වහන්සේ පරීක්ෂා නොකරන්න" යන්න ය.
03. "නුඹේ දෙවි ස්වාමීන්ට පමණක් නමස්කාර කරන්න" යන්න ය.
04. "නුඹේ දෙවි ස්වාමීන්ගේ නාමය අගරු ලෙස භාවිත නොකරන්න" යන්න ය.

39. කමාව දීම හා ලැබීම ගැන කියැවෙන උපමා කථාව වන්නේ,
01. පොහොසත් මෝඩයාගේ උපමාව ය. 02. කමා නොවූ දාසයාගේ උපමාව ය.
03. යහපත් සමාරිතයාගේ උපමාව ය. 04. නැති වූ බැටළුවාගේ උපමාව ය.

40. අන්වෙසක් වීමේ සිද්ධිය අවස්ථාවේ දර්ශනය වූ පුද්ගලයින් දෙදෙනා වන්නේ,
01. එළියා හා මෝසෙස් ය. 02. මෝසෙස් හා ආබ්‍රහම්ය.
03. එලිෂා හා මෝසෙස්ය. 04. එළියා හා පේදුරුය.

(1x40 = 40)

සියලු හිමිකම් ඇවිරිණි/ All Rights reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**Provincial Department of Education - NWP**

**15 S II**

පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2018

First Term Test - Grade 11 - 2018

විභාග අංකය ....................................

# ක්‍රිස්තියානි ධර්මය II

කාලය පැය දෙකයි

- **පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න..**

01. කෙටි පිළිතුරු ලියන්න.

i. අ. සෑම ජුදෙව් නමකම තිබූ විශේෂත්වය සඳහන් කරන්න.
ආ. "ජේසුස්" යන්නෙහි අර්ථය ලියන්න.

ii. ජේසුස් වහන්සේ ප්‍රකාශ කළ නාසරෙත් ප්‍රකාශයෙහි සඳහන් කරුණු 02 ක් ලියන්න.

iii. පරිසිවරු හා සද්දුසිවරු ජේසුස් වහන්සේ වෙත ඉදිරිපත් කළ චෝදනා එක බැගින් ලියන්න.

iv. රාත්‍රී කාලයේ ජේසුස් වහන්සේ වෙත පැමිණ ඔහුගේ ප්‍රශ්නවලට විසඳුම් සෙවූ ජුදෙව් නායකයා කවුද? ජේසුස් වහන්සේ ඔහුට දුන් පිළිතුරු කුමක්ද?

v. "ඔබ පරීක්ෂාවට නොවැටෙන පිණිස යාච්ඤා කරන්න." ජේසුස් වහන්සේ මෙසේ ප්‍රකාශ කළ අවස්ථාව කුමක්ද? එයින් ඉදිරිපත් කරන සත්‍යය කුමක්ද?

vi. පහත පාඨය නිවැරදිව සම්පූර්ණ කරන්න.
දැන් සාගිනි ඇති ඔබ භාග්‍යවන්තයෝය ............................

vii. ලාදුරු රෝගීන් දස දෙනා සුව කිරීමෙන් හා දෙව් මැදුරේ පඬුරු පිදූ දුගී කාන්තාවගේ ක්‍රියාවෙන් ජේසුස් වහන්සේ ඉගැන්වූ ඉගැන්වීම කුමක්ද?

viii. දෙවියන් වහන්සේ ආබ්‍රහම් අතර ඇති කරගත් ගිවිසුමේ අඩංගු පොරොන්දු 2 ලියන්න.

ix. එඬේරුන් ලෙස අප තුළ තිබිය යුතු ගුණාංග 02 ලියන්න.

x. පාවුල්තුමා සඳහන් කරන ආකාරයට ප්‍රේමය නොමැත්තා සමාන කර ඇති දේවල් 2 නම් කරන්න.

ලකුණු 2x10 =20

02. i. අ. ජේසුස් වහන්සේ තම සේවය ගැන අනාවරණය කරන ලද්දේ කුමන අවස්ථාවේ දී ද?
ආ. එහිදී කියවනු ලැබූ පැරණි ගිවිසුමේ ග්‍රන්ථය කුමක්ද? (ල. 02)

iii. එම දේශනයට ජනතාව දුන් ප්‍රතිචාර 03 ක් ලියන්න. (ල. 03)

iv. නූතන සමාජයේ විවිධ අවශ්‍යතා ඇති අයට උපකාර කළ හැකි අවස්ථා 05 ක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

03. i. ජේසුස් වහන්සේ පේදුරුට පැවරූ කාර්යය කුමක්ද? ඊට පේදුරුතුමාගේ පිළිතුර කුමක්ද? (ල. 02)

ii. ජේසුස් වහන්සේගේ දුක් ප්‍රාප්තියට සම්බන්ධ වූ තුන් දෙනෙක් නම් කරන්න. (ල. 03)

iii. එක් එක් පුද්ගලයින්ගේ ජීවිත තුළින් අපේ කිතුණු දිවියට ගතහැකි ආදර්ශ 05 ක් ලියන්න. (ල. 05)

04. i. ජේසුස් වහන්සේ ජීවත් වූ කාලයේ පලස්තීනය කුමන අධිරාජ්‍යයකට යටත්ව තිබුණේද? එහි අධිරාජ්‍යයා කවුරුන්ද? (ල. 02)

ii. අධිරාජ්‍යයා ජනතාව පීඩාවට පත්කළ ආකාර 03 ලියන්න. (ල.03)

iii. ව්‍යවස්ථාව - නීති රීති සම්ප්‍රදායන් හා වත් පිළිවෙත් මිනිසාගේ යහපතට මිස මිනිසා පීඩාවට පත් කිරීමට යොදා නොගත යුතු බව ජේසුතුමා පෙන්නුම් කළ අවස්ථා 05 ක් ලියන්න. (ල. 05)

05. i. ඇදහිල්ල නිසා දුක්වින්ද පැරණි ගිවිසුමේ සඳහන් දෙදෙනෙක් නම් කරන්න. (ල. 02)

ii. ඔවුන්ගෙන් එක් අයෙකුට දුක් විඳීමට සිදුවූ ආකාර 03 ක් ලියන්න. (ල. 03)

iii. දුක් උසුලන සේවකත්වය තුළින් ජේසුස් වහන්සේ අපට ලබාදෙන ආදර්ශ 05 ක් ලියන්න. (ල. 05)

06. i. පහත බයිබල් පද සම්පූර්ණ කරන්න.
සාමය ඇති කරන්නෝ භාග්‍යවන්තයෝය. ඔවුහු ............................................................
යුක්තිය උදෙසා පීඩා විඳින්නෝ භාග්‍යවන්තයෝය. .........................................

ii. යෙසායා දිවැසිවරයා ප්‍රකාශ කරන ආකාරයට සාම රාජ්‍ය තුළ දක්නට ලැබෙන ලක්ෂණ 03 ක් ලියන්න. (ල. 03)

iii. සාමය කඩවන අවස්ථා 5 ක් සඳහන් කර එම අවස්ථා මඟහැරීමට අපට කළ හැකි කාර්යයන් 05 ක් සඳහන් කරන්න. (ල. 05)

07. පහත සඳහන් මාතෘකා 02 ක් තෝරා කෙටි සටහන් ලියන්න.
i. යහපත් බැටළු එඬේරා
ii. මුල් ශ්‍රාවකයින් කැඳවීම
iii. දේව රාජ්‍ය තුළ නායකත්වය
iv. කිතුණු දිවියට යාච්ඤාව (ල. 05)
v. දිවැසිවර සේවය

(5+5 = 10)

පළමු වාර පරීක්ෂණය - 2018
ක්‍රිස්තියානි ධර්මය - 11- ශ්‍රේණිය
පිළිතුරු පත්‍රය

I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | -2 | 11 | -2 | 21 | -2 | 31 | - 1 |
| 2 | -3 | 12 | -3 | 22 | -3 | 32 | - 4 |
| 3 | -1 | 13 | -2 | 23 | -1 | 33 | - 2 |
| 4 | -2 | 14 | -2 | 24 | -4 | 34 | - 3 |
| 5 | -1 | 15 | -3 | 25 | -1 | 35 | - 4 |
| 6 | -3 | 16 | -4 | 26 | -2 | 36 | - 4 |
| 7 | -4 | 17 | -3 | 27 | -4 | 37 | - 4 |
| 8 | -2 | 18 | -2 | 28 | -1 | 38 | - 2 |
| 9 | -4 | 19 | -1 | 29 | -2 | 39 | - 2 |
| 10 | -1 | 20 | -3 | 30 | -3 | 40 | - 1 |

(1x40 = 40)

01. I. අර්ථයක් තිබීම. "දෙවියන් වහන්සේ මුදන සේක"
ii. දිළිඳුන්ට සුභාරංචිය දේශනා කිරීම, වහලුන්ට මිදීම ලැබෙන බව දැන්වීම, අන්ධයන්ට පෙනීම ලැබෙන බව දැන්වීම, පීඩිත වූවන් මුදවාලීම, ස්වාමීන් වහන්සේගේ ප්‍රසාදලත් වසර ප්‍රකාශ කිරීම.
iii. පරිසිවරු - පව්කමා කිරීම, සබත කඩකිරීම, සබත්දින සුවකිරීම, ගෝලයන් උපවාසයේ නොයෙදීම
සද්දුසිවරු - පුනර්ජීවනය පිළිබඳ ප්‍රශ්නය, බදු ගෙවීම, දේව මාළිගය, පවිත්‍ර කිරීමේ අධිකාරි බලය
iv. නිකදේමුස් - ජීවිතයේ අභ්‍යන්තර වෙනසක් ඇතිකර ගැනීම.
v. ගෙත්සෙමනෙ උයනේ ජේසුස් වහන්සේ මරණයට පෙර යාච්ඤා කිරීමට ගිය අවස්ථාවේ ගෝලයන්ට මෙය ප්‍රකාශ කළේය.
vi. මන්ද ඔබ තෘප්තිමත් වනු ඇත.
vii. ස්තුතිවන්ත බව හා පිදීමේ වැදගත්කම
viii. ඔහු විශාල ජාතියක පියා බවට පත්වීම, දේශයක උරුමය ලැබීම, අන්‍යයන්ට ආශිර්වාදයක් වීම. (කරුණු 02ක් තිබිය යුතුය.)
ix. එඬේර ප්‍රේමය, කැපවීම, සේවකත්වය
x. සෝෂා කරන සණ්ඨාරයකට හෝ කටුකරාවය දෙන කෛතාලමකට

(2x10 = 20)

02. I. නාසරෙත් දේශනය සිදුකළ අවස්ථාවේ දී, යෙසායාගේ පොත
ii. ජේසුස් වහන්සේ කළ ඉගැන්වීම ප්‍රතික්ෂේප කිරීම, කෝපවීම, මරණයට පත්කිරීම, සඳහා කන්දෙන් පහළට හෙලනු ලබන්නට තැත් කිරීම.
iii. දිළිඳු අය (සමාජයේ කොන් කළ අය) වහළුන් (විවිධ අන්දමේ වහල්භාවයට පත් වූවන්, ආර්ථික දුෂ්කරතා ඇති අය, සමාජ හිංසනයට ලක් වූ අය, අනාථභාවයට පත් වූ (ස්වභාවික විපත්, ඥාතීන් මියගිය) ආදී අයට උපකාර කිරීම පිළිබඳ ලියා තිබීම.

(2+3+5 =10 )

03. I. "යළිත් ඔබ හැරුණු පසු ඔබේ සහෝදරයින් ධෛර්යමත් කරන්න."
පිළිතුර- ඔබ වෙනුවෙන් මරණයට වුවද මුහුණදීමට මම සූදානම් වී සිටිමි.
ii. පේදුරු, සිරේනියේ සීමොන්, ස්ත්‍රීන්, සොරුන්, මුර සෙබළුන්, අරිමාතියේ ජෝසෙප් (03 දෙනෙක් නම් කළ යුතුය)
iii. පේදුරු - අප ජීවිත තුළ තාවකාලික පසුබැසීම් සිදු වුවද එය නොතකා දේව රාජ්‍යයේ වැදගත් වගකීම් අප වෙත පවරන බව.

| | |
|---|---|
| සිරේනියේ සීමොන් | - අප නොසිතූ පරිදි නොසිතූ වෙලාවක දේව රාජ්‍යයේ මෙහෙවරට දායක වීමට ඇරයුම් ලැබෙන බව. |
| ස්ත්‍රීන් | - පැමිණෙන්ට තිබෙන පාපයෙන් පිරි ලොව තුළ අත්විඳින්නට සිදුවන විපත් පිළිබඳව |
| සොරුන් | - ජීවිතයේ අවසන් මොහොතේ දී වුවද තම වරද පිළිගෙන පසුතැවිලි වී කමාව ලැබීම. |
| මුරසෙබළුන් | - අපගේ දිවිය තුළ මුහුණ දෙන පරීක්ෂාවන්හිදී දේව වචනයෙන් ශක්තිමත් වී එඩිතරව ඊට මුහුණදීම. |

(2+3+5 =10 )

04. i. ✶ රෝම අධිරාජ්‍යයට ✶ අගෝස්තුස් සීසර් අධිරාජ්‍යයා
ii. ✶ ජුදා වැසියන් යටත් වැසියන් ලෙස සැළකීම
✶ ඔවුන්ගෙන් අධික ලෙස බදු අය කිරීම.
✶ සුංගම් අය කරන්නන් විසින් ජුදෙව්වන් පිළිබඳව අනුකම්පා විරහිතව කටයුතු කිරීම.
✶ රෝම පාලනය යටතේ හේවායෙකුගේ බඩුමිටිය සැතැපුමක් දුර රැගෙන යාමට ජුදෙව්වන්ට බල කිරීම.

iii. ✶ අංශභාග රෝගියෙකු සුවපත් කළ අවස්ථාව
✶ ලෙවි කැඳවූ අවස්ථාව
✶ සබත්දින දිය උදර රෝගියෙකුට සුවය
✶ සබත්දින අතක් පණ නැති මිනිසාට සුවය
✶ උපවාස කිරීම පිළිබඳ ප්‍රශ්නයේ දී
✶ සබත කඩකිරීම සම්බන්ධ ප්‍රශ්නය
✶ අත් සේදීමේ පිළිවෙත ඉටු නොකළ බවට චෝදනා කළ අවස්ථාවේ දී (2+3+5 =10)

05. i. ජෝබ් හා ජෙරමියා
ii. ජෝබ් - ✶ ගේ දොර අහිමි වීම
✶ඉඩකඩම් අහිමිවීම
✶දරුවන් අහිමිවීම
✶මෙහෙකරුවන් අහිමිවීම
✶බැටළුවන්, ඔටුවන් අහිමිවීම
✶කුෂ්ඨ රෝගය ඇතිවීම.

ජෙරමියා - ✶පෙරමියා ජනතාවට දේශනා කරන විට
✶අනාවැකිය ප්‍රකාශ කරන විට
✶හිරගෙදරට රැගෙන යාම
✶මඩ පිරුණු වලක දැමීම
✶දවස් ගණනක් කෑම ලබානොදීම.

iii. ✶ විවිධ දුක් කම්කටොළු වලට මුහුණ දීමට සිදුවන බව.
✶ දුක් විඳීම ජයග්‍රහණයක ආරම්භයක් බව.
✶ සියල්ලේදී දේව කැමැත්තට ඉඩදිය යුතු බව.
✶ තමන්ට වන හානිය ගැන නොසළකා පසුබට නොවී සියල්ලට මුහුණදීම.
✶ ධෛර්යෙන් යුක්තව සෑම අභියෝගයකටම මුහුණදීම.
✶ ලෝකයා උදෙසා තම ජීවිතය පිදීමෙන් (2+ 3+5 = 10)

06. i. ✶ ඔවුහු දෙවියන් වහන්සේගේ පුත්‍රයෝයැයි කියනු ලබන්නේය.
✶ ස්වර්ග රාජ්‍ය ඔවුන්ගේය.
ii. ✶ සාමයට කෙලවරක් නොමැත්තේය.
✶ එය ස්ථිරවම පිහිටුවන සේක
✶ ධර්මිෂ්ඨකම තිබීම.
✶ යුක්තිය දක්නට ලැබේ.
✶ පූර්ණ වූ සාමයක් තිබීම.

iii.

| <u>සාමය කඩවන අවස්ථා-:</u> | **ඒ සඳහා අපට කළ හැකි දේ-:** |
|---|---|
| ✶ අප කතා කරන වචන වලින් | - සැමවිටම යහපත් වචන කථා කිරීම. |
| ✶ අප තුළ උපදින සිතුවිලි වලින් | - යහපත් සිතුවිලි ඇතිකර ගැනීම |
| ✶ අප කරන ක්‍රියාවන් තුළින් | - යහපත් ලෙස ක්‍රියා කිරීම |
| ✶ විරුද්ධකම් වලින් | - විරුද්ධවාදී ලෙස නොහැසිරවීම |
| ✶ මනුෂ්‍ය ස්වභාවයට උචිත නොවන ලෙස හැසිරීම | - මනුෂ්‍ය ගුණ ධර්ම අනුව ජීවත්වීම |
| ✶ පළිගැනීම | - පළිගැනීමට යොමු නොවීම. |

(2+3+5 =10 )

07. පහත මාතෘකා අතරෙන් 2 ක් තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.

1. යහපත් බැටළු එඬේරා (11 ශ්‍රේණිය පිටු අංක 7-10)
2. මුල් ශ්‍රාවකයින් කැඳවීම (10 ශ්‍රේණිය පිටු අංක 30-33)
3. දේව රාජ්‍යය තුළ නායකත්වය ( 10 ශ්‍රේණිය 103-105)
4. කිතුණු දිවියට යාච්ඤාව (10 ශ්‍රේණිය පිටු අංක 57-59)
5. දිවැසිවර සේවය ( 10 පෙළපොත පිටු අංක 1-3)

(5+5 =10 )